**ශීර්ෂය 20 - මැතිවරණ කොමිෂන් සභාව පිළිබඳ විගණකාධිපති වාර්තාව 2017 වර්ෂය**

2017 අංක 32 දරන විසර්ජන (සංශෝධන) පනතින් සංශෝධිත 2016 අංක 24 දරන විසර්ජන පනතේ පළමුවන උපලේඛනයේ හා තෙවන උපලේඛනයේ සඳහන් ශීර්ෂය හා විෂය අංකය යටතේ වන විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශය මැතිවරණ කොමිෂන් සභාව විසින් විගණනයට ඉදිරිපත් කරන ලදී. එම ගිණුම්වලින් හා සැසඳුම් ප්‍රකාශනවලින් නිරූපනය වන මූල්‍ය හා භෞතික කාර්යසාධනය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව ප්‍රකාරව විගණනය කරන ලදී.

## 1.2 ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ මූල්‍ය කළමනාකරණය හා ගිණුම් කටයුතුභාවය පිළිබඳ වගකීම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 124 ප්‍රකාරව රාජ්‍ය මුදල් ඉපැයීම සහ රජයට ලැබිය යුතු මුදල් එකතු කිරීම මෙන්ම රජයේ සියළුම මුදල් කටයුතු අධීක්ෂණය පිළිබඳ පොදු අවේක්ෂණයද මුදල් අමාත්‍යවරයා වෙත පැවරී ඇත. මුදල් අමාත්‍යවරයා විසින් එම වගකීම ඉටු කිරීම පිණිස මුදල් රෙගුලාසි 124(2) ප්‍රකාරව ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන් පත් කර ඇත. මුදල් රෙගුලාසි 125(1)(අ) ප්‍රකාරව දෙපාර්තමේන්තු ප්‍රධානියා තම දෙපාර්තමේන්තුවේ සියළු මුදල් ගනුදෙනු පිළිබඳව ගණන්දීමේ නිලධාරියා වන අතර ආදායම් ගණන්දීමේ නිලධාරියා භාණ්ඩාගාරය විසින් පත්කර ඇත. පාර්ලිමේන්තුව විසින් පනවන ලද සීමාවන් ඇතුළත තම කාර්යභාරයන් ඉටු කර ඉදිරිපත් කරනු ලබන ගිණුම් හා සැසඳුම් ප්රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රජයේ මුදල් රෙගුලාසි හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට ආදාල වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

## 1.3 විගණන විෂය පථය

ශීර්ෂය 20 - මැතිවරණ කොමිෂන් සභාවේ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය හා භෞතික කාර්යසාධනය සම්බන්ධයෙන් සැලැසුම් කිරීම, රාජ්‍ය වියදම්, රාජ්‍ය ආදායම්, මානව හා භෞතික සම්පත් කළමනාකරණය, අභ්‍යන්තර පාලන විධිවිධාන යොදා ගැනීම, නීති,රීති හා රෙගුලාසිවලට අනුකූලවීම හා පොත්පත්, ලේඛන, වාර්තා හා සැසඳුම් ප්‍රකාශන යාවත්කාලීන කර පවත්වා ගැනීම, ගිණුම් පිළියෙල කර කාලීනව ඉදිරිපත් කිරීම, කාර්යසාධන දර්ශක පදනම් කරගෙන අදාළ පාර්ශවයන් වෙත කාර්යසාධන වාර්තා නිකුත් කිරීම පිළිබඳව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2018 ජූලි 24 දින කොමිෂන් සභාවේ මැතිවරණ කොමසාරිස් ජනරාල්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද සැලැසුම්, ගිණුම්, සැසඳුම් ප්‍රකාශන හා කාර්යසාධන වාර්තා පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

## 1.4 විගණන නිරීක්ෂණය

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මැතිවරණ කොමිෂන් සභාවේ සිදු කරන ලද විගණනයේදී අනාවරණය වූ විගණන නිරීක්ෂණ ඉහත 1.3 ඡේදයේ සඳහන් කර ඇති කළමනාකරණ විගණන වාර්තාවේ විස්තරාත්මකව දක්වා ඇත. එම නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ මෙම වාර්තාවේ 2.1 ඡේදයේ සිට 2.7 දක්වා ඡේදවල සඳහන් කර ඇත. මූල්‍ය පරිපාලනයේ ප්‍රමාණවත් බව තහවුරු වන පරිදි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 127 හි සඳහන් විධිවිධාන ඉටු කිරීමේදී අනාවරණය වූ පහත සඳහන් සටහනේ සාරාංශගත කර දක්වා ඇති විගණන නිරීක්ෂණවලට යටත්ව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වශයෙන් තම ගිණුම් කටයුතුභාවය සතුටුදායක ලෙස ඉටුකර තිබුණු බව නිරීක්ෂණය විය.

| **මුදල් රෙගුලාසි 127 ප්‍රකාරව ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ ගිණුම් කටයුතුභාවය** | | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරී එම විධිවිධානයට අනුගත වී නොතිබීම** | **නිරීක්ෂණය ඇතුළත් වාර්තාවේ ඡේද යොමුව** |
|---|---|---|---|
| මුදල් රෙගුලාසි | | | |
| 127 (1)(අ) | නිවැරදිව සහ මූල්‍ය විධිමත් බවෙන් යුක්තව කටයුතු කරන බව තහවුරුවන පරිදි සියළු මූල්‍ය කාර්යයන් සැලැසුම් කළ යුතු වීම. | 1. වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම නිවැරදි ලෙස පිළියෙල කර නොතිබීම. | |
| | | 2. කාර්යභාරය ඉටුකිරීමේ ප්‍රමාදයන් | 2.2.1 |
| | | 3. ප්‍රතිපාදන ඉතුරුවීම් | 2.2.2 |
| | | 4. ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම. | 2.5 |
| | | | 2.7 |
| 127(1)(ආ) | වියදම් සහ රාජ්‍ය ආදායම් එකතු කිරීම පිළිබඳව ප්‍රමාණවත් තරම් පාලනයකට විධිවිධාන සැලැසෙන ක්‍රමයක් සම්පාදනය කළ යුතුවීම. | 1. අනුකූල නොවීම් | 2.6 |
| | | 2. මානව සම්පත් කළමනාකරණයේ අඩුපාඩු. | 2.8 |
| | | 3. විසඳා නොතිබුණු විගණන ඡේද | 2.3 |

| | | | |
|---|---|---|---|
| 127(3) | ස්වකීය පරිපාලනාත්මක කෘතහස්තතාව හා විචාර බුද්ධිය මෙහෙයවා සුදුසු පරිදි ක්‍රියා කළ හැකි වන පිණිස සැකැයක් හෝ උද්ගත වී ඇති සියළු ප්‍රශ්ණ තමා වෙත ඉදිරිපත් වෙන ආකාරයක් සලසා තිබීම. | වත්කම් ඌන උපයෝජනය/ නිෂ්ක්‍රීයව පැවැතීම. | 2.3 |

## 2. ප්‍රමාණාත්මක සහ වැදගත් විගණන නිරීක්ෂණ

## 2.1 කොමිෂන් සභාවේ ප්‍රධාන කාර්යභාරයන්

(අ) ඡන්ද හිමියන් ලියාපදිංචි කිරීම හා ඡන්ද හිමි නාම ලේඛනය සකස් කිරීම

(ආ) ජනාධිපතිවරණ, ජනමතවිචාරණ, පාර්ලිමේන්තු, පළාත් සභා හා පළාත් පාලන ඡන්ද විමසීම් පැවැත්වීම.

(ඇ) සර්වජන ඡන්ද බලය හා අයිතිය පිළිබඳව ඡන්ද දායකයන් දැනුවත් කිරීම

## 2.2 කාර්යසාධනය

### 2.2.1 සැලැසුම් කිරීම

කොමිෂන් සභාව 2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව 2017 වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කර නොතිබුණි.

### 2.2.2 කාර්යභාරයන් ඉටු කිරීම්

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

මැතිවරණ කොමිෂන් සභාවට ලැබෙන පැමිණිලිවලට කඩිනමින් විසඳුම් ලබාදීම උදෙසා මැතිවරණ පැමිණිලි කළමණාකරණ පද්ධතිය සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය ආරම්භ කර මුළු ඇස්තමේන්තු මුදල වන රු.1,952,500 එකවර ගෙවා තිබුණි. එසේ වුවද, මෙම ව්‍යාපෘතිය 2017 අගෝස්තු 15 දින වන විට නිමකල යුතු වුවද එම කාර්යය 2018 ජුනි 08 දින වන විටත් නිමකිරීමට නොහැකි වී තිබුණි.

## 2.3 වත්කම් කළමනාකරණය

**ඌන උපයෝජිත වත්කම්**

පහත සඳහන් වත්කම් ඌන උපයෝජිතව පැවති බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

(i) රු.7,500,000 ක් වටිනා කැබ් රථයක් 2015 සැප්තැම්බර් 08 දින අනතුරට ලක් වී ධාවනය කල නොහැකි තත්වයට හානි වී වසර 02 කට අධික කාලයක් නිෂ්ක්‍රීයව ආයතන පරිශ්‍රයේ ගාල්කර තිබුණි. මෙම වාහනය සඳහා පූර්ණ හානි පදනම මත රු. 5,500,000 ක් ගෙවීමට අදාළ රක්ෂණ සමාගම 2018 ජූලි 17 දිනැති ලිපියෙන් එකඟතාව පළ කර තිබුණු අතර ලියාපදිංචිය අවලංගු කිරීමේ කටයුතු අවසන් වී නොතිබුණි.

(ii) ප්‍රාදේශීය කාර්යාල 03 ක් සඳහා රු.2,645,500 ක් වැයකර මිලදී ගෙන තිබුණු වායුසමීකරණ යන්ත්‍ර 25 ක් විදුලි තැතදුම් කටයුතු ප්‍රමාදවීම හේතුවෙන් මාස 03 ක පමණ කාලයක් නිෂ්ක්‍රීයව පැවතුණි. 2018 ජූලි 24 දින වන විටත් ඉන් වායු සමීකරණ 12 ක් සඳහා විදුලි තැතදුම් ලබා දීමට කටයුතු කර නොතිබුණි.

(iii) ඡන්ද හිමි නාමලේඛනය පිළියෙල කිරීමට අදාලව කොමිෂන් සභාවේ පරිගණක දත්ත පද්ධතියේ පවත්නා දත්තවල ආරක්ෂාව උදෙසා පරිගණක ආපදා ප්‍රතිස්ථාපන මධ්‍යස්ථානයක් හම්බන්තොට මැතිවරණ කාර්යාලයේ සකස් කිරීමට 2017 දෙසැම්බර් 31 දින වන විට රුපියල් මිලියන 11.6ක් වැයකර තිබුණි. ගෙවීම් සිදු කළද ගිනි ආරක්ෂණ පදධතියේ කොටස් සවිකිරීම පමා වීම නිසා අදාල උපකරණ (Servers) සවිකිරීම 2018 ජූලි 13 දින දක්වා මාස 07 ක් ප්‍රමාද වී තිබුණි.

(iv) මැතිවරණ පැමිණිලි කළමනාකරණ පද්ධතිය සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය ස්ථාපිත කර නොතිබුණි. සැලසුම් කල ව්‍යාපෘතිය සඳහා මිලදී ගත් රු.891,000 ක් වටිනා රූපවාහිනී යන්ත්‍ර 27 අදාල කාර්යයට යොදා ගැනීමට නොහැකිව ඌන උපයෝජිතව පැවතුණි.

## 2.4 විසඳා නොතිබුණු විගණන ඡේද

කොමිෂන් සභාවට අදාළව 2016 වර්ෂයේ විගණකාධිපති වාර්තාවේ 3.3 ඡේදයේ ඇතුළත්ව තිබුණු රු. 966,969 ක් වැයකර ඉදිකල ඡන්ද පෙට්ටි ගබඩාව සහිත හීන් ඇළ රක්ෂිතයට අයත් ඉඩම කොමිෂන් සභාවට පවරා ගැනීට කටයුතු කරමින් පවතින අතර මෙතෙක් පවරා ගැනීමේ කටයුතු අවසන් වී නොතිබුණි.

## 2.5 කාර්යභාරයන් ඉටු කිරීම සඳහා පාර්ලිමේන්තුව විසින් සලසා තිබුණු ප්‍රතිපාදනය උපයෝජනය කිරීම

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂ 05 ක කාලය තුළ මැතිවරණ කොමිෂන් සභාවට සමාලෝචිත වර්ෂයේ සලසා තිබුණු ප්‍රතිපාදනය, උපයෝජනය හා ඉතිරිය පිළිබඳ තොරතුරු හා ඒ පිළිබඳ විගණන නිරීක්ෂණ පහත දැක්වේ.

| වර්ෂය | වියදම් වර්ගය | ශුද්ධ ප්‍රතිපාදනය<br>-------------<br>රු.මිලියන | උපයෝජනය<br>--------------<br>රු.මිලියන | ඉතිරිය<br>--------<br>රු.මිලියන | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස<br>--------------- |
|---|---|---|---|---|---|
| 2013 | පුනරාවර්තන | 1,328.90 | 1,313.67 | 15.23 | 01 |
| | මූලධන | 41.00 | 40.61 | 0.39 | 01 |
| | **එකතුව** | 1,369.90 | 1,354.28 | 15.62 | 01 |
| 2014 | පුනරාවර්තන | 2,113.45 | 2,099.12 | 14.33 | 01 |
| | මූලධන | 81.00 | 79.71 | 1.29 | 02 |
| | **එකතුව** | 2,194.45 | 2,178.83 | 15.62 | 01 |
| 2015 | පුනරාවර්තන | 5,913.43 | 5,802.76 | 110.67 | 02 |
| | මූලධන | 52.97 | 46.15 | 6.82 | 13 |
| | **එකතුව** | 5,966.40 | 5,848.91 | 117.49 | 02 |
| 2016 | පුනරාවර්තන | 3,581.80 | 577.56 | 3,004.24 | 84 |
| | මූලධන | 57.51 | 55.28 | 2.23 | 04 |
| | **එකතුව** | 3,639.31 | 632.84 | 3,006.47 | 83 |
| 2017 | පුනරාවර්තන | 4,456.01 | 788.62 | 3,667.39 | 82 |
| | මූලධන | 110.83 | 105.86 | 4.97 | 04 |
| | **එකතුව** | 4,566.84 | 894.48 | 3,672.36 | 80 |

සමාලෝචිත වර්ෂය සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

අධ්‍යාපන අමාත්‍යාංශය හා එක්ව සර්වජන ඡන්ද බලය පිළිබඳව පාසල් සිසුන් දැනුවත් කිරීමේ වැඩමුළු පැවැත්වීම සඳහා පරිපූරක ඇස්තුමේන්තුවක් මගින් රු.4,800,000ක් වෙන්කර ගත්තද එම මුළු ප්‍රතිපාදනයම ඉතිරි වී තිබුණි.

## 2.6 අනුකූල නොවීම්

-----------------

මුදල් රෙගුලාසි අංක 1647(ආ) ප්‍රකාරව මැතිවරණ කොමිෂන් සභාව සතු වාහනද ඒවායේ උපකරණද පිළිබඳ සම්පූර්ණ සමීක්ෂණයක් පැවැත්විය යුතු වුවද එවැනි සමීක්ෂණයක් සිදුකර නොතිබුණි.

## 2.7 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

-----------------------------------------------

**වත්කම් කළමනාකරණය**

--------------------------

කොමිෂන් සභාවේ වත්කම් සම්බන්ධයෙන් 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය ප්‍රකාරව ස්ථාවර වත්කම් ලේඛනයක් විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණි.

**2.8** **මානව සම්පත් කළමනාකරණය**

**අනුමත කාර්ය මණ්ඩලය, තථ්‍ය කාර්ය මණ්ඩලය හා පුද්ගල පඩිනඩි සඳහා වියදම**

ඉහත 2.1 ඡේදයේ සඳහන් කාර්යභාරය ඉටු කිරීම සඳහා 2017 දෙසැම්බර් 31 දිනට අනුමත, තථ්‍ය, පුරප්පාඩු හා අතිරික්ත කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර පහත දැක්වේ.

| | සේවක වර්ගය | අනුමත සංඛ්‍යාව | තථ්‍ය සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 52 | 49 | 03 | - |
| (ii) | තෘතියික මට්ටම | 21 | 09 | 12 | - |
| (iii) | ද්විතියික මට්ටම | 476 | 420 | 56 | - |
| (iv) | ප්‍රාථමික මට්ටම | 222 | 190 | 32 | - |
| (v) | අනියම්/කොන්ත්‍රාත්/ | 01 | 809* | - | 808 |
| | | 772 | 1477 | 103 | 808 |

* සමාලෝචිත වර්ෂය අවසාන වන විට පුරප්පාඩු 103 ක් පැවතුණු අතර මැතිවරණ කොමිෂන් සභාවේ අනුමැතිය මත මැතිවරණ කටයුතු සඳහා අනියම් හා කොන්ත්‍රාත් පදනමින් සේවකයින් 682 ක්ද විශ්‍රාමික නිලධාරීන් 127 ක්ද වශයෙන් 809 දෙනෙකු 2017 දෙසැම්බර් 05 දින සිට 2018 පෙබරවාරි 28 දින දක්වා බඳවා ගෙන තිබුණි.